# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2415/79 - 2024 දෙසැම්බර් මස 22 වැනි ඉරිදා - 2024.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 16 වන වගන්තිය සමඟ කියවිය යුතු 112 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**නියෝග**

2005 ඔක්තෝබර් මස 12 වැනි දින අංක 1414/19 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2005 රක්ෂණ නියාමන කොමිෂන් සභා නියෝගවල 3 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීම මගින් ඒ නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"3 රක්ෂණකරුවකු විසින් වාර්ෂිකව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට ගාස්තුවක් වශයෙන් :-

(අ) ක්‍රියාත්මක වන පළමු ලිත් වර්ෂය සඳහා රුපියල් එක් ලක්ෂයක මුදලක් ගෙවනු ලැබිය යුතුය :-

එසේ වුව ද, 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වන වගන්තියට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු බවට නියම කරනු ලැබ ඇති රක්ෂණකරුවකු විසින් ක්‍රියාත්මක වන පළමු ලිත් වර්ෂය සඳහා දළ ලිඛිත වාරික මුදලින් 0.2% ක් වූ වාර්ෂික ගාස්තුවක්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට ගෙවනු ලැබිය යුතුය ; *සහ*

(ආ) ක්‍රියාත්මක වන දෙවන ලිත් වර්ෂය ආරම්භ වන දින සිට සහ ඉන් පසුව :-

(i) රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් රුපියල් ලක්ෂ දෙකක මුදලක් ; *හෝ*

(ii) රක්ෂණ ව්‍යාපාරයේ පෙර මුදල් වර්ෂයේ දළ ලිඛිත වාරික මුදලින් 0.2% ක්

යන මුදල් ප්‍රමාණ අතරින් වඩා වැඩි මුදල ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට ගෙවනු ලැබිය යුතුය."

ඉහත සඳහන් නියෝග ක්‍රියාත්මක කිරීම 2024.12.23 සිට ක්‍රියාත්මක වේ.

EOG 12 - 0302

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.